# සාපේක්ෂ හා නිරපේක්ෂ පැවැත්ම

ලෝකයේ ඇති වඩාත් ම ගැඹුරු ම ප්‍රශ්නය පැවැත්ම යනු කුමක් දැයි නිර්වචනය කිරීම යැයි සිතමි. ක්වොන්ටම් භෞතිකය සම්බන්ධයෙන් ගත් කල බටහිර දර්ශනයෙහි ඊනියා යථාර්ථවාදී අර්ථකථනයකට හා ඉන්ද්‍රියානුභූතවාදී අර්ථකථනයකට මගපෑදුවේ ද මේ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නය ය. අප ආත්මය, අනාත්මය, සසර, නිවන ආදිය ගැන සාකච්ඡාවක් ඇති කරන්නේ ද මූලික වශයෙන් බෞද්ධ සංස්කෘතියෙහි මේ ප්‍රශ්නයට පිළිතුරක් නිර්මාණය කිරමට ය. ඉන්පසු ඒ ආශ්‍රිතව ක්වොන්ටම් භෞතිකයෙහි පැවැත්ම ගැන කිව හැක්කේ කුමක් දැයි නිර්මාණය කිරමට ය.

ක්‍රිස්තු වර්ෂයෙන් දෙවැනි සියවසෙහි ජීවත් වූ ආන්ද්‍ර බ්‍රහ්මණ පවුලක උපත ලත් නාගර්ජුනපාදයන් වහන්සේ මේ ප්‍රශ්නය ඉතා ගැඹුරින් සාකච්ඡා කළ තැනැත්තා යැයි සිතමි. ඒ සඳහා උන්වහන්සේ යොමු වී ඇත්තේ ථෙරවාදීන් දරන යම් මතයක් පිළිගැනීමට නොහැකි වූ බැවින් යැයි නිගමනය කළ හැකි ය. ඒ මතය අන්කිසිවක් නො ව ස්වභාවය පිළිබඳව ථෙරවාදීන් දැරූ මතය විය.

ඇතැම් ධර්මවලට ස්වභාවයක් ඇතැ යි යන්න ථෙරවාදීන් ගේ මතය වෙයි. මේ ධර්ම ඉතා කුඩා කලක් පවතින ධර්ම වෙයි. එක් අතකින් ගත් කල මේ ඉතා කුඩා කලක් පවතින ධර්ම අනෙක් ධර්ම ගොඩනගන ධර්ම වෙයි. එනම් අනෙක් ධර්ම නිර්මාණය වන්නේ මේ ධර්මවල සංයෝජනයෙන් ය. මේ කුඩා කලක් පවතින ධර්ම ද අනෙක් ධර්ම මෙන් ම ඇති වී නැති වී යයි. එහෙත් ඒ ධර්මවලට අනෙක් ධර්මවලට මෙන් නො ව නිසග ගුණ වෙයි. ස්වභාවය යනු මේ නිසග ගුණ හෝ ගුණය වෙයි. ඒ ගුණය අදාළ ධර්මයට වෙනත් ධර්මයක හෝ ධර්මවල හෝ පැවැත්මක් නැති ව වුව ද තිබෙයි. වෙනත් වචනවලින් කිව හොත් නිරක්ෂකයකු ඇතත් නැතත් ඒ ධර්මවලට නිසග ගුණ වෙයි.

නාගර්ජුනපාදයන් ගේ විවේචනයට හසු වූයේ මේ ස්වභාවය පිළිබඳව කෙරුණු අර්ථකථනය ය. ධර්මයකට ස්වභාවයක් ඇත්නම් ඉන් කියැවෙනුයේ යම් ආකාරයක ආත්මයක් ඒ ධර්මයට ඇති බව ය. මෙහි දී ආත්මය යනුවෙන් ගැනෙන්නේ පුද්ගල ආත්මයක් පමණක් නො වෙයි. පුද්ගලාත්ම ඇත්තේ ප්‍රාණීන්ට ය. ධර්මවලට ඇත්තේ ධර්මාත්ම ය. ධර්මයකට අනෙක් ධර්මවලින් ස්වායත්ත වූ ස්වභාවයක් ඇතැ යි යනුවෙන් කියැවෙන්නේ ඒ ධර්මයට නෛසර්ගික වූ ධර්මාත්මයක් ඇති බව ය. එවැනි ආත්මයක පැවැත්ම උපකල්පනය කිරීම බුද්ධදහමට එකඟ නො වේ ය යන්න නාගර්ජුනපාදයන් පළ කළ මතය වෙයි.

ආත්මයක් ඇත්නම් එය වෙනස් නොවන්නක් වෙයි. අනෙක් ධර්ම (වස්තු, නිරක්ෂකයන්) ඇතත් නැතත් අදාළ ආත්මය පවතියි. ඒ පැවැත්ම නිරපේක්ෂ වෙයි. නිරපේක්ෂ වූ පැවැත්මක් නිත්‍ය වෙයි. අනිත්‍ය වූ ආත්මයක් තිබිය හැකි ද? යමක් වෙනස්වන්නේ නම් ඒ වෙනස්වන්නේ කා හට කුමකට සාපේක්ෂව ද? වෙනත් වස්තුවකට, ධර්මයකට සාපේක්ෂ නො වන යමක් ඇත්නම් ඒ වෙනස් විය යුත්තේ එයට ම සාපේක්ෂ ව ය. එහෙත් එහි තේරුම කුමක් ද?A ට සාපේක්ෂ ව,A වෙනස් වන්නේ ය යන්නෙහි තේරුම කුමක් ද?A ට සාපේක්ෂව,A වෙනස් වී ඇත්නම් එතැන තවදුරටත්  A පවතින්නේ යැ යි කිව හැකි නො වෙයි. එවිටAට සාපේක්ෂව,A වෙනස්වන්නේ ය යන්න ම තේරුමක් නැති දෙයක් බවට පත් වෙයි.

නාගර්ජුනපාදයන් වහන්සේ උන්වහන්සේ ගේ සාපේක්ෂතා දර්ශනය ඉදිරිපත් කෙළේ එවැනි පසුබිමක ය. එය ථෙරවාදීන් ගේ ස්වභාවය පිළිබඳ අර්ථකථනයට විරුද්ධව ඉදිරිපත් කළ එකක් විය. ථෙරවාදීන්ට අනුව ධර්මාත්ම පැවතිණි. ඒ ඉතා සුළු කාලයකට විය හැකි ය. එවැනි ධර්මයක් පැවතුණේ ක්ෂණයකට යැයි ථෙරවාදීහු කී හ. ථෙරවාදයෙහි ක්ෂණවාදය නමින් ගැඹුරු ප්‍රවාදයක් ඇති වූයේ ද මේ ධර්මාත්ම ප්‍රශ්නය තේරුම් කිරමට යැමේ දී ය. ක්ෂණවාදය ගැඹුරු වුවත් ක්ෂණයකට හෝ ආත්මයක් යම් ධර්මයකට ඇතැ යි පැවසීම බුද්ධදහම සමග එකඟ නො වෙයි. එබැවින් මෙහි දී ථෙරවාදයෙහි යම් අඩුවක් තිබෙන බව අපට පිළිගැනීමට සිදු වෙයි.

අප ථෙරවාදීන් බව සැබෑ ය, එහෙත් එයින් කියැවෙන්නේ අප දැනට ථෙරවාදයෙහි අඩංගු සියල්ල ඒ අයුරින් ම පිළිගත යුතු ය යන්න නො වෙයි. ථෙරවාදයෙහි අඩංගු දෑ අතර ඇතැම් පුද්ගලයන් විසින් කරන ලද අර්ථකථන ද

© Prof. Nalin De Silva

වෙයි. එහි බුදුන්වහන්සේ දෙසූ දැට අමතර කරුණු ද වෙයි. එසේ අමතර කරුණු තිබීම වරදක් නො වෙයි. විවිධ කාලවල දී විවිධ පුද්ගලයන් බුදුන්වහන්සේ දෙසූ ධර්මයට විවරණ සපයා ඇත. ඒ ඇතැම් විවරණ අපි පිළිගනිමු. ඇතැම් විවරණ ප්‍රතික්ෂෙප කරමු. ඒ අතර අපි ද විවරණ සපයමු. අතීතයේ දී බුදුදහමට විවරණ සපයා ඇති අය අතර අප වැනි පෘථග්ජනයෝ ද වූ හ. ඒ පෘථග්ජනයන් සැපයූ විවරණවල වැරදි තිබිය හැකි ය. අප ඒ පිළිබඳව විමසිලිමත් විය යුතු ය. අපට පෙනෙන වරදක් අප ථෙරවාද සම්ප්‍රදායෙහි ම පිහිටා නිවැරදි කර ගත යුතු ය. එමෙන් ම අවශ්‍ය තැන්වල අප ද විවරණ සැපයිය යුතු ය. සිංහල ථෙරවාද සම්ප්‍රදාය විකාශය විය යුත්තේ එලෙස මිස ථෙරවාදයෙහි තිබූ පමණින් ඇතැම් පෘථග්ජන පුද්ගලයන් විසින් කෙර ඇති විවරණ ඒ 'අයුරින් ම පිළිගැනීමෙන් නො වෙයි. එමෙන් ම අද අප යම් විවරණයක් සැපයුව හොත් එය හෙට විවේචනයට ලක් වී ප්‍රතික්ෂේප වීමට ද ඉඩ ඇති බව අමතක නො කළ යුතු ය.

නාගර්ජුනපාදයන්ට ථෙරවාදයෙහි කියැවෙන සවභාවය පිළිබඳ විවේචනයක් විය. ඒ විවේචනයෙහි සාධාරණයක් ඇත. එසේ කී පමණින් අපි මාධ්‍යමිකයෝ නො වෙමු. එසේත් නැත හොත් මහායානිකයෝ නො වෙමු. මාධ්‍යමිකයකු හෝ වෙනත් මහායානිකයකු නො වී අපට ථෙරවාදයෙහි කියැවෙන ස්වභාවය විවේචනය කළ හැකි ය. ඒ අතර ම අපට මාධ්‍යමිකවාදය ද ප්‍රතික්ෂේප කළ හැකි ය. එහෙත් අප අමතක නො කළඬ යුතඬු කරුණක් වෙයි. එනම් අපට ථෙරවාදය පිළිබඳ ව නාගර්ජුනපාදයන් වහන්සේ කළ විවේචනය ප්‍රතික්ෂේප කර උන්වහන්සේ ගේ මාධ්‍යමිකවාදය ප්‍රතික්ෂේප කළ නොහැකි බව ය.

ස්වභාවය පිළිබඳ ථෙරවාදී අර්ථකථන ආරක්‍ෂා කරමින් මාධ්‍යමිකවාදය විවේචනය කිරමට ගිය විට අපට නොයෙකුත් ගැටලුවලට මුහුණ පෑමට සිදු වෙයි. නාගර්ජුනපාදයන් වහන්සේ කළ ද අපි උන්වහන්සේ ස්වභාවය සම්බන්ධයෙන් කළ විවේචන පිළිගනිමු. ඒ විවේචනයට සරිලන පරිදි ථෙරවාදයට නව අර්ථකථනයක් දෙමු. ඉන්පසු ඒ නව අර්ථකථන යොදා ගනිමින් මාධ්‍යාමිකවාදය විවේචනය කර ප්‍රතික්ෂේප කරමු. එවැනි ක්‍රියාදාමයකින් තොර ව අපට ථෙරවාදය වර්ධනය කරගත නොහැකි ය. ථෙරවාදයෙහි වර්ධනය කිරමට දෙයක් නොමැති බවත් බුදුන්වහන්සේ අවශ්‍ය සියල්ල දේශනා කර ඇති බවත් මෙහි දී යමකු පැවසීමට ඉඩ ඇත. එහෙත් අපට පෙන්වා දීමට සිදුවන්නේ ඒ ඒ කාලවල පොදුවේ දැනුම වර්ධනය වී ඇති ප්‍රමාණයට සරිලන අයුරින් ථෙරවාදී අර්ථකථන සමාජයෙහි ජීවත් වන්නවුන් බබලාපොරොත්තු වන බව ය. එසේ ම විවිධ පුද්ගලයන් ඒ ඒ කාලවල එලෙස අර්ථකථන සපයා ඇති බවත් ය. අවාසනාවකට අද නව ථෙරාවදී අර්ථකථන නො සැපයෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස ථෙරවාදය අතීතයට අයත් වුවක් ලෙස හඳුන්වනු ලැබීමෙහි ප්‍රවණතාවක් වෙයි. ථෙරවාදී සම්ප්‍රදායෙහි නව අර්ථකථන හා නව දැනුම් බිහි කිරම සංවිධානාත්මක ව අරඹහ කළ යුතු ව ඇත.

අපේ ගැටලුව පැවැත්ම හෙවත් සත්බව ය. ඉතා සුළු කාලයකට (ක්‍ෂණයකට) හෝ ධර්මයක් වෙනත් ධර්මයකට (නිරක්‍ෂකයකුට) සාපේක්‍ෂ නො වී පැවැත්ම බුදුදහමට පටහැනි වේ ය, යන විවේචනය අප විසින් පිළිගනු ලැබිය යුතු ය. ධර්මයක් සුළු කාලයකට හෝ පැවතී නැති වී යෑම උච්ඡේදවාදියකුට හැරෙන්නට වෙනත් අයකුට පිළිගත හැකි නො වෙයි. බුදුන්වහන්සේ ශාස්වතවාදය මෙන් ම උච්ඡේදවාදය ද, ප්‍රතික්‍ෂෙ කළ හ. සුළු කාලයකට හෝ පවතින ධර්මයක් නැතැ යි කී විට ඉන් කියැවෙන්නේ පරමාර්ථ වශයෙන් සුළු කාලයක් හෝ පවතින ධර්ම නොමැති බව ය. සම්මුති වශයෙන් සුළු කාලයක් නො ව දීර්ඝ කාලයක් පවතින වස්තු, ධර්ම ආදිය තිබීම ගැටලුවක් නො වෙයි.

ධරමයකට ස්වභාවයක් ඇතැ යි කී විට පැන නගින ගැටලුව වනුයේ වෙනත් කිසිවකට සාපේක්‍ෂ නො වී පරමාර්ථ වශයෙන් ක්‍ෂණයකට හෝ ධර්මයකට පැවතීමට හැකි වීම ය. පරමාර්ථ වශයෙන් ක්ෂණික ව හෝ පැවතීම අපි ප්‍රතික්ෂේප කරමු. සියලු ධර්ම සාපේක්‍ෂ වෙයි. ධර්ම සාපේක්‍ෂ වන්නේ වෙනත් නිරක්‍ෂකයන්ට ය. ඒ නිරක්‍ෂකයන් තවත් නිරක්‍ෂකයන්ට සාපේක්‍ෂ වෙයි. එහෙත් මෙහි දී කිසිවකුට ගැටලුවක් පැනනගිනු ඇත. ඒ ගැටලුව අපි පහත සඳහන් අයුරින් සූත්‍රගත කරමු.

A නම් ධර්මයක්, B නම් ධර්මයකට ද, B නම් ධර්මයක්,A නම් ධර්මයකට ද සාපේක්‍ෂ යැ යි සිතමු. එවිට පළමුව ඇත්තේ A නම් ධර්මය ද, නැත්නම් B නම් ධර්මය දැ යි කෙනකුට ප්‍රශ්න කිරමට හැකි ය.A නම් ධර්මය පළමුව ඇති වුව හොත් වෙනත් ධර්මයක් නැති අවස්ථාවල A නම් ධර්මය පවතින්නේ ද? එනම්,A නම් ධර්මයට

© Prof. Nalin De Silva

ස්වභාවයක් ඇත් ද? ධර්මයනට ස්වභාව නැතැ යි ප්‍රකාශ කළ විට ඉන් ගම්‍යවන වැදගත් කරුණක් නම් ලොවෙහි මුල් ධර්මයක් හෝ නිරීක්ෂකයකු හෝ නොපවතින බව ය. ධර්ම එකිනෙකට සාපේක්ෂ වෙයි.

ධර්මයක් පවතින්නේ ම වෙනත් ධර්මයකට සාපේක්ෂ ව ය. එකිනෙකට සාපේක්ෂ ධර්ම පවතින්නේ සම්මුති ආකාරයකින් මිස පරමාර්ථ ආකාරයකින් නො වෙයි. සම්මුතියෙන් එකිනෙකට සාපේක්ෂ වූ ධර්ම පවතින්නේ චක්‍රීය ආකාරයකට ය. මුල් ධර්මයක් නැති විට ඒක රේඛීය භාවය ද නැති වෙයි. එහෙත් මෙහි වෙනසක් වන අවස්ථාවක් ද වෙයි. පුටුවක් පවතින්නේ මට සාපේක්ෂ ව යැයි කිව හැකි ය. පුටුවක් වැනි අචේතනික දෙයක් පමණක් නො ව සත්ත්වයකු වුව ද පවතින්නේ වෙනත් නිරීක්ෂකයකුට සාපේක්ෂ ව ය. මෙහි දී මතුවන ගැටලුව නම් නිරීක්ෂකයකු තමාට සාපේක්ෂ ව තමා නිරීක්ෂණය කරන්නේ, හඳුනාගන්නේ කෙසේ ද යන්න ය.

මගේ මිත්‍රයා මට සාපේක්ෂ ව සම්මුති වශයෙන් පවතියි. එමෙන් ම මම ද, මගේ මිත්‍රයාට සාපේක්ෂ ව පවතින්නෙමි. ඒ අතර මම මට ද සාපේක්ෂ ව පවතින්නෙමි. මා විසින් මම යැයි පුද්ගලයකු හඳුනාගනු ලැබෙයි. ඒ පුද්ගලයා කවුද? ඒ පුද්ගලයාට නිරපේක්ෂ පැවැත්මක් තිබෙ ද? ඒ පුද්ගලයාට ස්වභාවයක් තිබෙ ද? ඒ පරමාර්ථයක් ද? අපි මේ ප්‍රශ්නය මේ ආකාරයෙන් ම නොවුව ද සාකච්ඡා කර ඇත්තෙමු. මනස මනසට සාපේක්ෂ වේ ය යන ප්‍රවාදය අප අතින් නිර්මාණය වුයේ මේ ප්‍රශ්නය සාකච්ඡා කිරමට යාමේ දී ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva